# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government


| මගේ අංකය / எனது இல / My No | R/පොදු/1 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2020.03.27 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>වාර්ෂික ස්ථාන මාරු හෝ සාමාන්‍ය ස්ථාන මාරු හෝ ලබා 2020 මාර්තු මාසය තුළ නව සේවා ස්ථානවලට වාර්තා කරන ලද නිලධාරින්ට සහ 2018.08.20 දින සංවර්ධන නිලධාරි සේවයේ පත්වීම් ලබා වසරක අභ්‍යාසලාභී පුහුණුව අවසන් කර ඇති උපාධිධාරීන්ට සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ සහ 2 පන්තියේ II ශ්‍රේණියේ නවක පත්වීම්ලාභී (2020.03.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලද) නිලධාරින්ට වැටුප් ගෙවීම</u>**

රටේ දැනට පවත්නා තත්ත්වය ද සැලකිල්ලට ගෙන පහත සඳහන් නිලධාරි කාණ්ඩවලට වැටුප් ගෙවීම සම්බන්ධව අවධානය යොමු කරන ලදී.

1. වාර්ෂික ස්ථාන මාරු හෝ සාමාන්‍ය ස්ථාන මාරු හෝ ලබා 2020 මාර්තු මාසයේ නව සේවා ස්ථානවලට වාර්තා කරන ලද/ වාර්තා කිරීම සඳහා පූර්ව සේවා ස්ථානයෙන් මුදා හරින ලද නමුත් මෙතෙක් තම නියමිත වැටුප නොලබන නිලධාරින්
2. 2018.08.20 දින උපාධිධාරී අභ්‍යාසලාභී ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව අවසන් කර විධිමත් පත්වීම් ලබා දී ඇති, නමුත් 2020.03.16 දින වන විට නව සේවා ස්ථානයේ රාජකාරී භාර නොගත් නිලධාරින් සහ 2020.03.16 වන දිනට පෙර රාජකාරී භාර ගත් නමුත් මේ වන විටත් වැටුප් ලබා නොමැති නිලධාරින්
3. 2018.08.20 දින සිට උපාධිධාරී අභ්‍යාසලාභී ලෙස පත්වීම් ලබා වසරක පුහුණුව සම්පූර්ණ කිරීම මත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ පසු සම්මුඛ පරීක්ෂණයේදී අනාවරණය වූ යම් යම් කරුණු හේතුවෙන් විධිමත් පත්වීම් ලබා නොදී රඳවා ගත් නිලධාරින් සහ 2020.02.27 දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරින්
4. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සඳහා සහ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා 2020.03.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇති, එසේ පත් කරන අවස්ථාව වන විටත් රාජ්‍ය සේවයේ යම් යම් තනතුරුවල සේවය කරන නිලධාරින් සහ ඉහත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තනතුරු භාර ගැනීම සඳහා මේ වන විටත් මුදා හැර ඇති නිලධාරින්

02. ඉහත 1,2,3 සහ 4 හි සඳහන් නිලධාරි කාණ්ඩ සියල්ලට මාර්තු සහ අප්‍රේල් මාසවල අභ්‍යාසලාභී දීමනාව හෝ වැටුප ඉහත නිලධාරි කාණ්ඩ මෙතෙක් සේවය කළ හෝ අභ්‍යාසලාභී පුහුණුව ලැබූ ස්ථානයෙන්ම ගෙවීමේ කටයුතු සිදු කරන මෙන් කාරුණික දන්වා සිටිමි.

03. නිලධාරින් විධිමත් පරිදි රාජකාරී කටයුතු භාර ගැනීමෙන් අනතුරුව සිය පූර්ව සේවා ස්ථානයෙන් ලබා ගත් වැටුප් විස්තර නව සේවා ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු අතර එහිදී අධි ගෙවීමක් සිදු වී ඇති බව අනාවරණය වුවහොත් නිලධාරියාගෙන් එම මුදල අය කර ගැනීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු වේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை. / Independence Square, Colombo 07, Sri Lanka.
වෙබ් අඩවිය/ வெப்தளம் /Website: www.pubad.gov.lk